# විනිසුරුවන්ගේ විශ්‍රාමික වයස දීර්ඝ කිරීම අධිකරණ ස්වාධීනත්වයට බලපාන්නේ කෙසේද?

## ශ්‍රී ලංකා සහ විදේශීය නීති සමග සංසන්දනාත්මක විශ්ලේෂණයක්


### සාර සංක්ෂේපය

මෙම පර්යේෂණාත්මක ලිපිය මගින් යෝජිත ඉහළ අධිකරණ දෙකේ විනිසුරු විශ්‍රාමික වයස දීර්ඝ කිරීම් පිළිබඳ ආණ්ඩුක්‍රමව්‍යවස්ථා සංශෝධනය අධිකරණ ස්වාධීනත්වයට බලපාන අයුරු දේශීය සහ විදේශීය නීති සමග සංසන්දනාත්මකව විශ්ලේෂණය කරයි



කතෘ: ආචාර්ය නීතිඥ රාජා ගුණරත්න

rdaramasirie@gamial.com

## විනිසුරුවන්ගේ විශ්‍රාමික වයස දීර්ඝ කිරීම අධිකරණ ස්වාධීනත්වයට බලපාන්නේ කෙසේද?

### ශ්‍රී ලංකා සහ විදේශීය නීති සමග සංසන්දනාත්මක නීතිමය විශ්ලේෂණයක්

### 1. හැඳින්වීම

අධිකරණ ස්වාධීනත්වය යනු නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පාලනයේ මූලික පදනමකි. ව්‍යවස්ථාදායකය සහ විධායකය තම බලතල සීමාව ඉක්මවා නොයන බව සහතික කිරීමේ අවසාන ආයතනික ආරක්ෂකයා වන්නේ ස්වාධීන අධිකරණයයි.

එබැවින් විනිසුරුවරුන්ගේ පත්වීම, ධුර කාලය, ඉවත් කිරීම, වැටුප් හා විශ්‍රාම වැටුප් සහ විශ්‍රාමික වයස වැනි කරුණු, සරල සේවා කොන්දේසි ලෙස සැලකීම වැරදිය. මේවා විනිසුරුවරයාට බාහිර බලපෑමකින් තොරව නීතිය ක්‍රියාත්මක කිරීමට හැකි වන ආයතනික ආරක්ෂාවන්ය.

2026 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ඉහළ අධිකරණවල විනිසුරුවන්ගේ විශ්‍රාමික වයස දීර්ඝ කිරීම පිළිබඳව ප්‍රසිද්ධ සාකච්ඡාවක් ඇති වී තිබේ. මේ පිළිබඳව වාර්තා වූ යෝජනාවන් සම්බන්ධයෙන් අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ ගැටලු මතුව ඇත.

එහෙත් මෙම ලිපියේ සාකච්ඡාව යෝජිත හෝ වාර්තා වූ සංශෝධනයක නිශ්චිත අන්තර්ගතය පිළිබඳ අවසාන තීරණයක් නොව, එවැනි සංශෝධනයක් ඉදිරිපත් වුවහොත් එය පරීක්ෂා කළ යුතු ව්‍යවස්ථාමය හා නීතිමය මූලධර්ම පිළිබඳ විශ්ලේෂණයකි.

### 2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අධිකරණ ස්වාධීනත්වය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XV පරිච්ඡේදය අධිකරණය පිළිබඳ ප්‍රතිපාදන සපයයි. 105(1) ව්‍යවස්ථාව මගින් ජනතාවගේ අයිතිවාසිකම්, නිදහස සහ අධිකරණ යුක්තිය ආරක්ෂා කිරීම සඳහා අධිකරණ ආයතන පිහිටුවා ඇත.

107 වන ව්‍යවස්ථාව වඩාත් වැදගත් වන්නේ එය "අධිකරණයේ ස්වාධීනත්වය-Independence of the Judiciary" යන උපශීර්ෂය යටතේ විනිසුරුවන්ගේ පත්වීම, ධුර කාලය, ඉවත් කිරීම සහ විශ්‍රාමික වයස සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය ආරක්ෂාවන් සපයන බැවිනි.

107(5) ව්‍යවස්ථාවට අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාමික වයස අවු. 65 කි,

අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාමික වයස අවු. 63 කි.

මෙම වයස් සීමාව සාමාන්‍ය රාජ්‍ය සේවකයකුගේ විශ්‍රාමික වයස ට- Retirement Age- සමාන නොවේ. එය විනිසුරුවරයාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානය දුර කාලයේ- Constitutional Tenure- කොටසකි. විශුව ලිංගම් එදිරිව ලියනගේ-

Visuvalingam v Liyanage- යන නඩු තීන්දුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලි කළේ ඉහළ අධිකරණවල විනිසුරුවරුන්ට ස්වකීය දුර කාලය පිළිබඳ ආරක්ෂිතභාවය -Security of Tenure- ලබා දීම ඔවුන්ගේ පෞද්ගලික ප්‍රතිලාභයක් සඳහා නොව, මහජන යහපත සහ රාජ්‍යයේ ආරක්ෂාව සඳහා බවයි.

**3. විශ්‍රාමික වයස සහ දූර කාලයේ ආරක්ෂිතභාවය- Security of Tenure-**

විනිසුරුවරයකුට තම ධූරය ස්ථාවරව පවත්වාගෙන යා හැකි බවට ඇති විශ්වාසය අධිකරණ ස්වාධීනත්වයේ- Judicial Independence- මූලික අංගයකි.

විනිසුරුවරයකුට තම ධූරය රජයේ හෙවත් ආණ්ඩුවේ කැමැත්ත මත හෝ දේශපාලන බලපෑම මත අහිමි විය හැකි නම්, ඔහුට හෝ ඇයට ජනප්‍රිය නොවන නමුත් නීතියට අනුකූල තීරණ ලබාදීමට අවශ්‍ය ආයතනික ස්වාධීනත්වය දුර්වල වේ.

මේ හේතුව නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විනිසුරුවන් ඉවත් කිරීම සඳහා විශේෂ ක්‍රමවේදයක් සපයා ඇත. මෙය විනිසුරුවරයාට පෞද්ගලික වරප්‍රසාදයක් ලබා දීමක් නොව, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමේ ආයතනික සහතිකයකි- Institutional Guarantee-;

**4. විශ්‍රාමික වයස -Retirement Age- වෙනස් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ වැදගත්ම තීන්දුව**

මේ සම්බන්ධයෙන් වර්තමාන සාකච්ඡාවේ වඩාත් වැදගත් නෛතික අධිකාරිය - Legal Authority-වන්නේ දේශීය ආදායම් (සංශෝධනය) කෙටුම්පත පිළිබඳ නඩු තීන්දුවක්- Re Inland Revenue (Amendment) Bill, S.C. (S.D.) Nos. 64–71/2022 ය.

එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ:

"Any Constitutional amendment to the retirement age or the period of office impacting on incumbent judges, whether directly or indirectly, will impinge on the independence of the judiciary and [be] violative of Article 3 which requires a Referendum."

මෙය අතිශය වැදගත් ප්‍රකාශයකි. එයින් පැහැදිලි වන්නේ විශ්‍රාමික වයස -Retirement Age- වෙනස් කිරීමේදී **"එය සාමාන්‍යයෙන් සියලුම විනිසුරුවන්ට අදාළ වේ" යන කරුණ පමණක් ප්‍රමාණවත් නොවන බවයි. එය දැනට ධූරයේ සිටින විනිසුරුවන්ට සෘජු-Direct - හෝ වක්‍ර බලපෑමක්- Indirect Effect- ඇති කරන්නේද යන්නද විමසා බැලිය යුතුය.**

එම නඩුවේදී අධිකරණය අවධාරණය කළ මූලධර්මය, වර්තමාන සාකච්ඡාවට සෘජුවම අදාළ වේ.

**5. තමාගේ නඩුවේ මිනිසුරුවරයා තමාම නොවිය යුතුය-Nemo judex in causa sua-**

අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ තවත් මූලික මූලධර්මයක් වන්නේ

Nemo judex in causa sua, එනම්, **"කිසිවෙකු තමන්ගේම නඩුවේ විනිසුරුවරයා නොවිය යුතුය" බවයි.**

මෙය ස්වභාවික යුක්තියේ- Natural Justice- පක්ෂග්‍රාහී භාවයට එරෙහි මූලික රීතියකි-Rule Against Bias-

මෙහි වැදගත්කම වන්නේ විනිසුරුවරයා සැබවින්ම පක්ෂග්‍රාහී බව ඔප්පු කිරීම පමණක්

නොවේ. සාධාරණ හා දැනුවත් නිරීක්ෂකයකුට- Any Reasonable Observer- පක්ෂග්‍රාහීභාවයක් ඇති බවට සාධාරණ සැකයක් ඇතිවීම පවා ඇතැම් අවස්ථාවල නුසුදුසු භාවය- Disqualification- සඳහා ප්‍රමාණවත් විය හැකිය.

මෙහි මූලික අදහස වන්නේ " යුක්තිය ඉටුකිරීම පමණක්් නොව එය ප්‍රකාශිතවම ඉටු වන බවටද පැහැදිලි විය යුතුය"- **Justice must not only be done; it must also manifestly be seen to be done-.**

**6. ශ්‍රී ලංකාවේ පක්ෂග්‍රාහී භාවය- Bias- සහ තමාගේ නඩුවේ විනිසුරුවරයා තමා නොවිය යුතුය Nemo Judex - යන මූලධර්ම පිළිබඳ නඩු තීන්දු**

**6.1. කරවිට ඉදිරිව අබේරත්න- Karawita v Abeyratne**- [1983] 2 Sri LR 306. මෙම නඩුවේදී අධිකරණය අවධාරණය කළේ, විනිශ්චයකරු සැබවින්ම පක්ෂග්‍රාහී නොවූවත්, සාධාරණ පුද්ගලයන්ට ඔහු පක්ෂග්‍රාහී විය හැකි බවට සත්‍යමය හැකියාවක් පෙනේ නම් ඔහු එම නඩුව නොඇසිය යුතු බවයි.

එහි මූලික හරය- Rationale- වන්නේ මහජන විශ්වසනීයත්වයයි- Public Confidence-. ඕනෑම සාධාරණ පුද්ගලයන්ට "විනිසුරුවරයා පක්ෂග්‍රාහී විය හැකිය" යන හැඟීම ඇති වූ විට අධිකරණය පිළිබඳ විශ්වාසය විනාශ වේ.

මෙය වර්තමාන විශ්‍රාමික වයස- Retirement-Age- ප්‍රශ්නයට ඉතා වැදගත් වේ. මන්ද, සැබෑ පක්ෂග්‍රාහිභාවය-Actual Bias - නොමැති වුවද, බැඳියාවන් පිළිබඳ දෘශ්‍යමාන ගැටුමක්- Apparent Conflict- ඇති වීම පමණක් අධිකරණමය සුජාතභාවය ට- Judicial Legitimacy - හානිකර විය හැකි බැවිනි.

**6.2. සයිමන් ඉදිරිව ජාතික නිවාස කොමසාරිස්- Simon v Commissioner of National Housing**

ශ්‍රේෂ්ඨාධිකරණය අර්ධ අධිකරණමය තීණය ගන්න නිලධාරියෙකු ද - Quasi-Judicial Decision-Maker - බැඳියාවන් නොමැති සහ පක්ෂග්‍රාහී - Disinterested and Unbiased- විය යුතු බව පිළිගත්තේය. මෙම නඩුවේදී - පක්ෂග්‍රාහීභාවය- Bias- සම්බන්ධයෙන් "සත්‍ය සම්භාවිතාව-Real Likelihood" - පැවතීම යන පරීක්ෂණය- Test - භාවිත කර තිබුණි.

මෙය අධිකරණමය තීරණ ගැනීමේදී පමණක් නොව-Judicial Decision-Making - අර්ධ අධිකරණමය කර්තව්‍යයන් -Quasi-Judicial Functions- සඳහාද ස්වභාවික යුක්තියේ- Natural Justice- පක්ෂග්‍රාහී භාවයට එරෙහි රීතිය-rule against bias- ක්‍රියාත්මක වන බව පිළිගෙන ඇත.

**6.3. ගාමිණී දිසානායක එදිරිව එම්. සී.එම්. කලීල්- Gamini Dissanayake v M.C.M. Kaleel**

[1993] 2 Sri LR 135 හිදී පක්ෂග්‍රාහීභාවය- Bias- සම්බන්ධයෙන් විෂයමූලික- Objective- සහ මනෝමූලික-Subjective Elements- මූලාංග දෙකම පිළිබඳව සාකච්ඡා කරන ලදී. අධිකරණය මෙහිදී සඳහන් කළේ පක්ෂග්‍රාහීභාවය- Bias- පිළිබඳ චෝදනා සෑම අවස්ථාවකම එකම දැඩි පරීක්ෂණයකින් පමණක් නොසලකා, අදාළ

තීරණ ගන්නා ආයතනයේ- Decision-Making Body ස්වභාවය සහ කරුණු අනුව පරීක්ෂා කළ යුතු බවයි.

මෙයින් පිළිබිඹු වන වැදගත් නීතිමය මූලධර්මය වන්නේ පක්ෂග්‍රාහීභාවය- Bias යනු- යාන්ත්‍රික රීතියක්- Mechanical Rule- නොව, සිතිමය කරුණු සහ ආයතනික සන්දර්භය- Factual and Institutional Context- තුළ පරීක්ෂා කළ යුතු මූලධර්මයක් බවයි.

**7. මූල්‍යමය බැඳියාව- Pecuniary Interest — තමාගේ නඩුවේ විනිසුරුවරයා තමා නොවිය යුතුය-**

Nemo judex principle- වඩාත් දෘඪ ආකාරය වන්නේ මූල්‍යමය බැඳියාව- Pecuniary Interest - හෙවත් තීරණයෙන් තමාට මූල්‍ය ප්‍රතිලාභයක් ඇතිවීමයි.

විනිසුරුවරයකු ඉදිරියේ ඇති නඩුවක තීරණය ඔහුගේ:

(a) වැටුප- Salary,
(b) විශ්‍රාම යැම-Pension,

(c)මූල්‍යමයඅයිතිවාසිකම්-Financial Entitlement,

(c) දේපලමය බැඳියාවන්- Property Interest,
(d) සමාගම් කොටස්-Shares,

(e) ස්වකීය පවුලේ මූල්‍යමය බැඳියාවන්-Family Financial Interest-

වැනි කරුණු කෙරෙහි ඍජු හෝ සැලකිය යුතු බලපෑමක් ඇති කරන්නේ නම්, ඔහු එම නඩුවේ සිටීම අපක්ෂපාතී විනිශ්චකරණයක්- Impartial Adjudication- පිළිබඳ බරපතළ ගැටලු ඇති කරයි. එවැනි අවස්ථාවක **"මම ඇත්තටම පක්ෂග්‍රාහී නොවෙමි"** යන මනෝමූලික සහතික වීම-subjective assertion ප්‍රමාණවත් නොවේ.

**8. විශ්‍රාමික වයස පිළිබඳ යෝජනාව සහ මූල්‍යමය බැඳියාවන්-Pecuniary Interest**

මෙහිදී විශ්‍රාමික වයස දීර්ඝ කිරීම- Retirement Age Extension- සම්බන්ධයෙන් සුවිශේෂී ව්‍යවස්ථාමය ගැටලුවක් මතු වේ. උදාහරණයක් ලෙස, දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටින විනිසුරුවරයකුගේ විශ්‍රාමික වයස- Retirement Age - අවු. 65 සිට 67 දක්වා දීර්ඝ කිරීමට යෝජනා කර ඇති බව සලකමු.

එවැනි පනත් කෙටුම්පතක- Bill- ආණ්ඩුක්‍රම ව්‍යස්ථානුකූලභාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120/121 ව්‍යවස්ථා- Constitutionality Article 120/121 - යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝග කළහොත්, එම විනිශ්චය ආසනයේ- Bench- සිටින විනිසුරුවන්ටම තමන්ගේ විශ්‍රාමික කාලය- Retirement Period- දීර්ඝ වීමෙන් ප්‍රතිලාභයක් ලැබිය හැකිය.

එම ප්‍රතිලාභය විශ්‍රාම යැම/මූල්‍යමය අයිතිවාසිකම්-Pension/Financial Entitlements කෙරෙහි බලපෑ හැකිය. එම නිසා නඩු තීන්දුවේ අවසාන ප්‍රතිඵලයට -Case Outcome- පුද්ගලික බැඳියාවන්- Personal Interest - බලපා ඇතැයි ඇතැයි සාධාරණ පුද්ගලයකුට සිතිය හැකිය.

මෙය සැබෑ පක්ෂග්‍රාහී භාවයක්-Actual Bias- තිබෙන බවට බවට තීරණය කිරීමක් නොවේ. එහෙත් දෘශ්‍යමාන පක්ෂග්‍රාහීභාවයක් හෝ

පක්ෂග්‍රාහී භාවයක් ඇති බවට සාධාරණ හැඟීමක්- Apparent Bias / Reasonable Apprehension of Bias- පිළිබඳ බරපතළ ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය- Constitutional Question- ප්‍රශ්නයක් මතු කරයි.

**9. සෙනරත් එදිරිව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සහ වෙනත් අය- Senarath** v Chandrika Bandaranaike Kumaratunga [2007] 1 Sri LR 59 නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරනු ලැබුවේ මහජනයාට අදාළව තීරණ ගැනීමේදී -Public Decision-Making - තමන්ගේ පෞද්ගලික අයිතිවාසිකම් හෝ බැඳියාවන්- interests- එම තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපෑමක් ඇති කරන්නේ නම් එයට සහභාගී වීමෙන් වැළකී සිටිය යුතු බවයි.මෙම නඩුවේදී **තමාගේ නඩුවේ විනිසුරු තමාම වීම පිළිබඳ මූලධර්මය-** Nemo judex principle- පිළිගෙන ඇත.

මෙය විශ්‍රාමික වයස පිළිබඳ ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය අභියෝගය- Retirement-Age Constitutional Challenge- සමඟ සම්බන්ධ කිරීමේ දී වැදගත් වන්නේ පෞද්ගලික ප්‍රතිලාභ- Personal Benefit- සහ පොදු තීරණ ගැනීම -Public Decision-Making- අතර ගැටුමක්- Conflict- පවතින බවයි.

## 10. විදේශීය නීතිය- එක්සත් රාජධානිය- United Kingdom

විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අඩු කිරීම් හෝ වැඩි කිරීමට ගන්නා ලද විධායක ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විදේශීය නඩු තීන්දු ගණනාවක් තිබේ. ඒ පිළිබඳ සලකා බැලීමද මෙහිදී වැදගත් වෙයි. එම නඩු තීන්දු අපගේ අධිකරණවල ට බැඳීම් සහගත බලපෑමක් ඇති නොකරත් යම් ආකාරයක උපදේශාත්මක බලපෑමක් ඉන් ලබාගත හැක.

### 10.1 R v Sussex Justices, ex parte McCarthy- [1924] 1 KB 256.

මෙම නඩු තීන්දුව ස්වභාවික යුක්තිය පිළිබඳව ඉතා වැදගත් නඩු තීන්දුවකි. අධිකරණය මෙහිදී අවධාරණය කළේ, අධිකරණය, යුක්තිය පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීමට, තීරණය ගන්නාගේ-Decision-Maker- අපක්ෂපාතිභාවය- Impartiality- පිළිබඳ සාධාරණ සැකයක් පවා වැදගත් බවයි.

### 10.2. Locabail (UK) Ltd v Bayfield Properties Ltd

Locabail (UK) [2000] QB 451 යනු නූතන පක්ෂග්‍රාහී පිළිබඳ මූලධර්මයේ- Modern apparent-Bias Doctrine - ප්‍රධාන අධිකාරිය- Authority වේ.

අධිකරණය මෙහිදී අවධාරණය කළේ සෑම නඩුවකදීම **සැබෑ පක්ෂග්‍රාහී භාවය- Actual Bias- ඔප්පු කිරීම අවශ්‍ය නොවන බවත්, සාධාරණ පුද්ගලයකුට පක්ෂග්‍රාහීභාවය- Bias- පිළිබඳ සාධාරණ සැකයක් ඇති වන තත්වයන් ප්‍රමාණවත්** බවයි.

### 10.3. R v Bow Street Metropolitan Stipendiary Magistrate, ex parte Pinochet [1999] 1 All ER 577

**Pinochet [1999] 1 All ER 577** නඩුව වඩාත් ප්‍රබල උදාහරණයකි. මෙහිදී එංගලන්තයේ ස්වාමි මන්ත්‍රී මණ්ඩලයේ House of Lords' Lord

හොෆ්මන්- Hoffmann- නැමති නීති ස්වාමිවරයා ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය- Amnesty International - සමඟ ඇති සම්බන්ධතාවයක් හේතුවෙන් එම නඩුවේ අපක්ෂපාතිභාවය- Impartiality- පිළිබඳ ගැටලුවක් මතු විය. එබැවින් පළමු තීන්දුව නිෂ්ප්‍රභා - Set Aside- කරන ලදී.

මෙහි මූලික මූලධර්මය වන්නේ; පෞද්ගලික හෝ ආයතනික සම්බන්ධතාවයක් එම නඩු තීන්දුවේ අවසාන ප්‍රතිඵලය-Case Outcome- සමඟ සම්බන්ධ සැබෑ අසාධාරණයක්- Actual Prejudice- ඇති බව ඔප්පු නොකළත්, අධිකරණ සුජාතභාවය පිළිබඳව- Judicial Legitimacy - ගැටලුවක් පවතින බවයි.

**11.** **ඔස්ට්‍රේලියාව:**

ඔස්ට්‍රේලියානු මහාධිකරණය **Ebner v Official Trustee in Bankruptcy (2000) 205 CLR 337** නඩුවේ දී මූල්‍යමය බැඳියාව- Pecuniary Interest- සහ පක්ෂග්‍රාහීභාවය පිළිබඳ සැකය- Apprehended Bias සම්බන්ධයෙන් ප්‍රමුඛ අධිකාරිය-Authority-වේ.

මෙහිදී අධිකරණය මූල්‍යමය බැඳියාවක්- Pecuniary Interest- ඇති විනිසුරුවරයකු සම්බන්ධයෙන් පක්ෂග්‍රාහී භාවය පිළිබඳ පරීක්ෂණය -Bias Test- කුමක්ද යන්න විග්‍රහ කළේය. එය පසුව ඔස්ට්‍රේලියානු පක්ෂග්‍රාහීභාවය පිළිබඳ නීති විද්‍යාවේ -Bias Jurisprudence- මූලික අධිකාරිය- authority- බවට පත්විය.

මෙයින් පැහැදිලි වන්නේ මූල්‍යමය බැඳියාව- Financial Interest- සහ අධිකරණමය අපක්ෂපාතිභාවය- Judicial Impartiality- අතර සම්බන්ධතාවය ඉංග්‍රීසි පොදු නීති විද්‍යාව- Common Law Kurisdictions- තුළ ද දැඩිව පිළිගෙන ඇති බවයි.

**12.** **කැනඩාව:**

කැනේඩියානු ශ්‍රේෂ්ඨාධිකරණය- Supreme Court- විසින් තීරණය කරන ලද Wewaykum Indian Band v Canada, [2003] 2 SCR 259 නඩුවේදී "පක්ෂග්‍රාහී භාවය පිළිබඳ සාධාරණ සැකය නැමැති පරීක්ෂණය- Reasonable Apprehension of Bias" Test- විස්තරාත්මකව ප්‍රතිනිර්මාණය කරන ලදී. ඒ අනුව අදාළ පරීක්ෂණය වන්නේ;

**සාධාරණ, නිවැරදි සිතකින් යුත් සහ තොරතුරු සහිත පුද්ගලයකු, කරුණු යථාර්ථවාදීව හා ප්‍රායෝගිකව සලකා බැලීමෙන්, විනිසුරුවරයාගේ ආපක්ෂපාතීභාවය- Impartiality- පිළිබඳ සාධාරණ සැකයක් ඇති කර ගනීද?** යන්නයි.

මෙම පරීක්ෂණය- Test- වෙනසුරුවන්ගේ විශ්‍රාමික වයසස පිළිබඳව කරුණ ට- Retirement-Age යෙදීමේදී වැදගත් වන්නේ, විනිසුරුවරයා තමන්ටම මූල්‍ය ප්‍රතිලාභයක්- Financial Benefit - ලැබිය හැකි ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය ප්‍රශ්නයක්- Constitutional Question- තීරණය කරන බව සාමාන්‍යයෙන් දැනුවත් නිරීක්ෂකයකු- Knowledge- Observer- දකින ආකාරය කුමක්ද යන්නයි.

**13. ඉන්දියාව:**

**A.K. Kraipak v Union of India, AIR 1970 SC 150** නඩුවේදී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය- Supreme Court - පක්ෂග්‍රාහීභාවය පිළිබඳ නීතිවිද්‍යාවේ - Bias Jurisprudence- ප්‍රමුඛ අධිකාරිය-Authority- වේ.

එහිදී තේරීම් මණ්ඩලයක-Selection Board- සාමාජිකයකු තමන්ම තේරීමට ඉදිරිපත් වූ අපේක්ෂකයකු විය. ඔහු තම නම සලකා බැලූ අවස්ථාවේදී පමණක් ඉවත් වූවත්, වෙනත් අපේක්ෂකයන් තෝරාගැනීම සම්බන්ධ සාකච්ඡාවලට- Deliberations- සහභාගී වීමෙන් බැදියාවන් පිළිබඳව ගැටුම-Conflict of Interest- මතු විය. ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරනු ලැබුවේ;

"එවැනි තත්වයකදී ස්වභාවික යුක්තිය සහ පක්ෂග්‍රාහීභාවයට එරෙහි රීතිය- Natural Justice and Rule against Bias- උල්ලංඝනය" කර ඇති බවයි.

මෙය වර්තමාන විශ්‍රාමික වයස පිළිබඳ විවාදයට- Retirement-Age Debate- ඉතා ප්‍රබල සන්සන්දනාත්මක අධිකාරිය -Comparative Authority-වේ.

තමන්ට සෘජුව හෝ ආසන්නව ප්‍රතිලාභයක් ලැබිය හැකි තීරණයකට තීරණය ගනු ලබන්නා- Decision-Maker- සහභාගී වීම ආයතනික අපක්ෂපාතිභාවය- Institutional Impartiality පිළිබඳ ගැටලුවක් ඇති කරන බවයි.

**14. යුරෝපා සංගම් අධිකරණය:**

**European Commission v Republic of Poland, Case C-619/18**, තීරණය විශ්‍රාමික වයස සහ අධිකරණ අධිකරණයේ ස්වාධීනත්වය- Retirement Age and Judicial Independence- සම්බන්ධයෙන් වර්තමාන ලෝකයේ වඩාත්ම වැදගත් නඩු තීන්දුවකි.

**පෝලන්තය එහි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාමික වයස අඩු කර එය දැනට ධූරවල සිටින විනිසුරුවරුන්ටද අදාළ වන පරිදි නීතියක් ගෙන ආවේය. විශ්‍රාමික වයස ඉක්මවා සේවය කිරීමට ජනාධිපතිවරයාට අභිමතය- Discretion- ලබා දී තිබුණි. යුරෝපීයානු සංගම් අධිකරණය (CJEU ) විසින් පහත සඳහන් මූලධර්ම සමග සලකා බලන ලදී.**

(අ) අධිකරණ ස්වාධීනත්වය සහ ධූරවලින් ඉවත් කළ නොහැකිභාවය- Judicial Independence and the Principle of Irremovability- එහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ එමඟින් යුරෝපියාණු සංගම නීතිය(EU law) උල්ලංඝනය කර ඇති බවයි. තවදුරටත් අධිකරණ සඳහන් කළේ අධිකරණයේ ස්වාධීනත්වය සාක්ෂාත් කිරීම පිණිසවිනිසුරුවන්ට බාහිර මැදිහත්වීම් වලින් නිදහස් විය යුතු බවයි.

(ආ) පීඩනවලින්(Pressure) ආරක්ෂා විය යුතු බව;

(ඇ) ධූරවලින් සුරක්ෂිත භාවය-Security of Tenure- තිබිය යුතු බව;

(ඇ) විශ්වාමික වයස පිළිබඳ නීති මගින්- Retirement-Age Laws- මගින් සාධාරණ සැකයක්- Reasonable Doubt - ඇති නොවිය යුතු බව. විශේෂයෙන්ම, දැනට ප්‍රකාශිත විශ්‍රාමික- Retirement Age- ඉක්මවා සේවය කිරීමට විධායකය අභිමතය- Executive Discretion- ලබා දීම මිනිසුරුවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ සාධාරණ සැකයක්- Reasonable Doubts- ඇති කළ හැකි බවයි.

**15. විශ්‍රාමික වයස දීර්ඝ කිරීම සහ විශ්‍රාමික වයස අඩු කිරීම අතර නීතිමය වෙනස**

විශ්‍රාමික වයස අඩු කිරීම දැනට ධූරවල සිටින විනිසුරුවන් ඉවත් කිරීමට භාවිත කළ හැකිය.

විශ්‍රාමික වයස දීර්ඝ කිරීම දැනට ධූරවල සිටින විනිසුරන්ට ට වැඩි කාලයක් ධූරයේ සිටීමට ඉඩ දෙයි.

මේ අවස්ථා දෙක එකිනෙකට විරුද්ධ ප්‍රතිඵල ඇති කළත්, ඒ දෙකෙන්ම අධිකරණ ස්වාධීනත්වයට- Judicial Independence - බලපෑම් ඇති කළ හැකිය.

මන්ද යත් විශ්‍රාමික වයස ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව- Government Policy- දැනට ධූරවල සිටින විනිසුරන් සම්බන්ධයෙන් -Incumbent Judges- තාවකාලිකව- *ad hoc*- වෙනස් කළ හැකි නම්, විනිසුරන්ගේ ධූරවල ස්ථිරභාවය දුර්වල කරයි.

ඒ අනුව මෙම නඩුවේදී දුන් යුරෝප සංගම් අධිකරණය තීරණය කරනු ලැබුවේ විනිසුරුවරුන්ගේ විශ්‍රාමික වයස පිළිබඳව වෙනස්කම් කිරීම අධිකරණ ස්වාධීනත්වයට බලපාන බවයි. බවයි.

**16. Article 3 — ජනතා පරමාධිපත්‍යය**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව යටතේ දක්වා ඇත්තේ පරමාධිපත්‍යය ජනතාව සතුව පවතින බවයි- Sovereignty resides in the People-. එම පරමාධිපත්‍ය තුළ, ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණය බල යන අංග ගැබ් වී ඇති බවයි.

**ශ්‍රේෂ්ඨාධිකරණය Re Industrial Disputes (Special Provisions) Bill සහ Re Inland Revenue (Amendment) Bil**l වැනි නඩු තීන්දු මගින් 3 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති පරමාධිපත්‍යය නැමැති මූලධර්මය අධිකරණයේ ස්වාධීනත්වය යන මූධර්මය සමග සම්බන්ධ කර ඇත. 2024 දි දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දු වේද Re Inland Revenue (Amendment) Bill හි දෙන ලද තීන්දුව උපුටා දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ දැනට ධූරවල සිටින විනිසුරුවරුන්ගේ විශ්‍රාමික වයස හෝ ධූරයේ කාලය- Tenure of Office - වෙනස් කිරීම අධිකරණ ස්වාධීනත්වයට බලපාන බව යි.

ඒ අනුව විශ්‍රාමික වයස යනු පෞද්ගලිකව එක් එක් විනිසුරුවන්ගේ සේවා ප්‍රතිලාභයක් ලෙස පමණක් නොව, මහජනතාව සතු පරමාධිපත්‍යය තුළ තිබෙන අධිකරණ බලය People's Judicial Sovereignty - ක්‍රියාත්මක කරන ආයතනයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහතිකයක් ලෙස- Constitutional Guarantee- ලෙස සැලකිය යුතු බවයි.

**17. 121 වන ව්‍යවස්ථාව සහ තමාගේ නඩුවේ විනිසුරුවරයා තමාම නොවිය යුතුය යන -Nemo Judex — ව්‍යවස්ථාමය උභතෝකෝටිකය**

120 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පතක්- Bill- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූලද යන්න තීරණය කිරීමේ අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුවේ.

121(1) ව්‍යවස්ථාව මගින් ඕනෑම පුරවැසියෙකුට පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුලත් කර දින සිට දින 14 ක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමේ අයිතිය ලබා දෙයි.

123 අවස්ථාව මගින් අධිකරණයට එකී පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන්නේ ද, එසේ නම් එය සම්මත කිරීමට පාර්ලිමේන්තුවේ බහුතරයක් ඡන්දය ට අමතරව ජනමත විචාරණයක් මගින් - Referendum - ජනතා විසින්ද අනුමත කිරීම අවශ්‍යද යන්න තීරණය කළ හැකිය.

**එබැවින් විශ්‍රාමික වයස සංශෝධනය කිරීම දැනට ධූරවල සිටින විනිශ්චයකාරවරුන්ගේම විශ්‍රාමික අයිතිවාසිකම්වල ට බලපාන්නේ නම්, මෙවැනි ප්‍රශ්නයක් මතුවිය හැකිය. එනම් තමන්ගේම ධූර කාලය සහ විශ්‍රාමික ප්‍රතිලාභ දක්වා ඇති පනත් කෙටුම්පතක ආණ්ඩුක්‍රම ව්‍යස්ථානුකූලභාවය තීරණය කිරීමේ ශ්‍රේෂ්ඨාධිකරණ අංශයක - Constitutional Bench - සිටිය හැකිද? යන්නයි.**

**මෙය ස්වයං නුසුදුසුකමක් වීමට තරම්- Automatic Disqualification-** බරපතල **ප්‍රශ්නයක් වන්නේ එය තමාගේ නඩුවේ විනිසුරුවරයා තමාම නොවිය යුතු යන මූලධර්මය- Nemo judex-,** දෘශ්‍යමාන **පක්ෂග්‍රාහී භාවය- Apparent Bias- සහ** මූල්‍යමය බැඳියාව**-Pecuniary Interest- යන මූලධර්ම සමග සැලකූවිට අදාල විනිසුරුවරු විසින් කරුණු හෙළි නොකිරීම හෙවත් කරුණු අනාවරණය නොකිරීම යන- Recusal Question - ප්‍රබල ප්‍රශ්නය මතුකරයි.**

**18.** මහජන විශ්වාසය — **Public Confidence**

අධිකරණයක සුජාතභාවය- Legitimacy- තීරණය වන්නේ එහි නීතිමය බලයෙන් පමණක් නොවේ. මහජනයා එම තීන්දු අපක්ෂපාතී, ස්වාධීන සහ සාධාරණ බවට විශ්වාස කළ කිරීමෙන්ය. එබැවින් සත්‍යය පක්ෂග්‍රාහීභාවය- Actual Bias- තීරණ ගැනීමේ අභිමානයට- decision-making integrity- හානි කරයි. දෘශ්‍යමාන පක්ෂග්‍රාහිභාවය-Apparent Bias මහජන විශ්වාසයට-Public Confidence - හානි කරයි. තවද බැඳියාවන් පිළිබඳ ආයතනික පටහැනිතාවය - Institutional Conflict of Interest අධිකරණ සුජාතභාවයට- Judicial Legitimacy - හානි කළ හැකිය. තවද මෙම ක්‍රියාමාර්ග දිගුකාලීනව එකිනෙක ශක්තිමත් කරන **" භයානක චක්‍රීය ප්‍රතික්‍රියා- spiral reaction"** වලට හේතු විය හැකිය. මෙම සංසිද්ධිය පහත සඳහන් ගැලීම් සටහනෙන් සංක්ෂිප්ත කර දැක්විය හැක.

**(i) දෘශ්‍යමාන බැඳියාවන් පිළිබඳ ගැටුම් මගින් - Perceived Conflict of Interest**

↓

**(ii) අධිකරණය පිළිබඳ මහජන විශ්වාසය අහිමි වේ - Loss of Public Confidence**

↓

**(iii) එහි ප්‍රතිඵලයක් ලෙස අධිකරණවල සුජාතභාවය මහජනතාව ප්‍රතික්ෂේප කරනු ඇත- Rejection of Judicial Legitimacy –**

↓

**(iv) ඉන් පසුව, අධිකරණ තීන්දු සහ නීතිය නොපිළිපැදීමට- Non-compliance ඔවුන් පෙළඹෙනු ඇත-**

↓

**(iv) එහි ප්‍රතිඵලය වන්නේ ආයතනික අස්ථාවර භාවය ඇතිවීමයි - Institutional Instability -**

↓

**(v)මහජන විශ්වාසය අහිමි වූ විට අවසානයේ නීතියේ ආධිපත්‍යය දුර්වල වනු ඇත- Weakening of Rule of Law.**

එබැවින් විශ්‍රාමික වයස සංශෝධනය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වලංගු වීම පමණක් නොව එය මහජනතාවට පෙනෙන ආකාරය ද වැදගත්ය.

**19. සාධාරණ ප්‍රතිසංස්කරණයක් සඳහා අදාල වන මූලධර්ම**

විශ්‍රාමික වයස වෙනස් කිරීම සම්පූර්ණයෙන්ම කිසිසේත්ම ආණ්ඩුක්‍රමස්ථානුකූලව කළ නොහැක්කක් යැයි කීම පිළිගත නොහැකි ප්‍රස්තුතයකි. ජාත්‍යන්තර නීතිය අනුව පෙනීයන්නේ විශ්‍රාමික වයස විවිධ රටවල් විසින් වෙනස් කර ඇති බවයි. නමුත් එවැනි වෙනස්කම් කිරීමේදී පහස සඳහන් කරුණු පිළිබඳව සැලකිලිමත් වියයුතුය.

(a) ඉදිරි අනාගතයට බලපාන- Prospective - වෙනස්කම් විය යුතුය;

(b) දැනට ධූරවල සිටින විනිසුරුවන් ට - Incumbent Judge- අදාල නොකළ යුතුය

(c) දේශපාලන පළිගැනීමක් හෝ දේශපාලන ත්‍යාගයක්- Political Retaliation- Political Reward - නොවිය යුතුය;

(d) විෂය මූලිකව ප්‍රතිපත්ති මත සාධාරණීකරණය කළ හැකි විය යුතුය- objective policy justification-,

(e) ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය විනිවිද භාවයකින් - Transparent Legislative Process- යුක්ත විය යුතුය;

(f) අධිකරණ ස්වාධීනත්වය සහ ධූර කාලයේ ස්ථිරභාවය - Judicial Independence and- Security of Tenure දුර්වල නොකළ යුතුය;

(g) විධායකයේ අභිමතය මත- Executive Discretion - එක් එක් විනිශ්චකාරවරයාගේ සේවා අඛණ්ඩතාවය- continuation - රඳා නොපැවතිය යුතුය;

(h) ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ කාර්යපටිපාටිය- Constitutional Amendment Procedure- සම්පූර්ණයෙන් ම අනුගමනය කළ යුතුය.

**Commission v Poland** හි දී යුරෝපියානු සංගම් අධිකරණය ආධාරණයය කළේ විශ්‍රාම ගැනීම පිළිබඳ වැඩපිළිවෙළ ට අදාළ කාර්ය පටිපාටිය මගින් විනිශ්චයකරුවන්ට බාහිර පීඩනයක් - External Pressure - ඇති නොකරන ආකාරයෙන් ඒවා නිර්මාණය කළ යුතු බවයි.

**20.** නිගමනය

විනිසුරුවන්ගේ විශ්‍රාමික වයස යනු සරල සේවා කොන්දේසියක් නොවේ. විශේෂයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය වැනි ඉහළ අධිකරණ සම්බන්ධයෙන් ඒවායේ සිටින විනිසුරුවන්ගේ ධූරකාලවල සුරක්ෂිත භාවය- security of tenure- සහ අධිකරණ ස්වාධීනත්වය- judicial independence - යන මූලික ව්‍යවස්ථාමය සංකල්ප සමඟ සෘජුව සම්බන්ධ වේ.

(a) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය්ථාවේ 107(5) වන ව්‍යවස්ථාව මගින් විශ්‍රාමික වයස නිශ්චිතව නියම කර ඇති අතර, 107 ව්‍යවස්ථාව මගින් මුළුමනින්ම අධිකරණයේ ස්වාධීනත්වය-judicial independence- යන උපශීර්ෂය යටතේ එය දක්වා ඇත.

(b) Visuvalingam v Liyanage නඩු තීන්දුව මගින් ධූර කාලය පිළිබඳ සුරක්ෂිතභාවය- security of tenure- නැමැති මූලධර්මයේ ගැබ් වී ඇති මහජන නීති ගුණාංගය -public-law character - තහවුරු කරයි.

(c) Karawita v Abeyratne නඩුව මගින් දෘශ්‍යමාන පක්ෂග්‍රහය භාවය- apparent bias - සහ මහජන විශ්වසනීයත්වය- public confidence- පිළිබඳ වැදගත් අධිකාරීන් සපයා ඇත.

(d) Senarath v Chandrika Bandaranaike Kumaratunga නඩු තීන්දුව මගින් පුද්ගලික බැඳියාවන්- personal interest - සහ අපක්ෂපාතී තීරණ ගැනීම- impartial decision-making අතර සම්බන්ධය අවධාරණය කරයි.

(e) වඩාත්ම වැදගත් Re Inland Revenue (Amendment) Bill නඩු තීන්දුව මගින් දැනට ධූරවල සිටින විනිශ්චකරුවන්ගේ- incumbent judges- විශ්‍රාමික වයස හෝ දූර කාලය- period of office- වෙනස් කිරීම අධිකරණ ස්වාධීනත්වය - judicial independence- සහ 3 වන ව්‍යවස්ථාව සමඟ සෘජුව සම්බන්ධ කර ඇත.

විදේශීය නීතියද එම මූලධර්මය ශක්තිමත් කරයි.

(a) Pinochet නඩුවේදී ආයත්නික සම්බන්ධතාවය- Institutional Connection- නිසා දෘශ්‍යමාන පක්ෂග්‍රාහීභාවය- Apparent Bias- ඇති විය හැකි බව පෙන්වයි;

(b) Ebner නඩු තීන්දුව මූල්‍යමය බැඳියාව- Pecuniary Interest- සම්බන්ධයෙන් වැදගත් අධිකාරිකාරියක්- authority වේ.

(c) Wewaykum නඩු තීන්දුව මගින් පක්ෂග්‍රාහී භාවය පිළිබඳ සාධාරණ සැකය නමැති පරීක්ෂණය- Reasonable Apprehension of Bias Test- වර්ධනය කරයි;

(d) A.K. Kraipak නඩු තීන්දුව මගින් තීරණ ගනු ලබන පුද්ගලයෙකුට පුද්ගලික බැඳියාවන්- Personal Interest- ඇති විට අපක්ෂපාතී තීරණයක් ගැනීමට- impartial decision-making- ඇති නොහැකියාව පිළිබඳ ගැටලුව පෙන්වයි;

(e) Commission v Poland නඩු තීන්දුව මගින් විශ්‍රාම යෑම් පිළිබඳ වැඩපිළිවෙලවල් - retirement arrangements- සහ අධිකරණ ස්වාධීනත්වය- Judicial Independence- අතර සෘජු සම්බන්ධය තහවුරු කරයි.

ඒ අනුව, දැනට ධූරවල සිටින විනිශ්චකරුවන්ට- Incumbent Judges-; මූල්‍ය හෝ වෘත්තීය ප්‍රතිලාභයක් ඇති විය හැකිවන පරිදි විශ්‍රාමික වයස සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූල භාවය - Constitutionality- විනිශ්චය කරන අධිකරණයේ අපක්ෂපාතිභාවය-Impartiality- පිළිබඳ සාධාරණ සැකයක්- Reasonable Apprehension- ඇතිවීමේ හැකියාව නොසලකා හැරිය නොහැක.

අවසානයේ ප්‍රශ්නය වන්නේ:

**"විනිසුරුවරයා පක්ෂග්‍රාහීද?" යන්න පමණක් නොව, "සාධාරණ හා දැනුවත් මහජන පුද්ගලයකුට මෙම ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ස්වාධීන හා අපක්ෂපාතී ලෙස පෙනේද?"** යන්නයි.

අධිකරණ ස්වාධීනත්වයේ සැබෑ අර්ථය ඇත්තේ එතැනය.

**යුක්තිය ඉටු කිරීම පමණක් නොව එය ඉටුවන බව පෙනීයා යුතුය-Justice must not only be done; but it must be seen to be done.**

2022 Inland Revenue (Amendment) Bill තීරණය මගින් ලැබෙන ඉතා ප්‍රබල ප්‍රස්තුතය වන්නේ-proposition - **වන්නේ දැනට ධූරවල සිටින විනිශ්චකරුවන්ගේ විශ්‍රාමික වයසට හෝ ධූර කාලයට සෘජු හෝ වක්‍ර බලපෑමක් ඇති කරන ශෝචිත ආණ්ඩුක්‍රමව්‍යවස්ථා සංශෝධන සහ 3 ව්‍යවස්ථාවේ දක්වා ඇති ජනතා පරමාධිපත්‍යය සමඟ සමඟ ගැටෙන බව ය.**

**ආචාර්ය නීතිඥ රාජා ගුණරත්න,**

**ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය,**

**නීති අධ්‍යන දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**